සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර විභාගය - 2018-

Second Term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: 1 | පැය / மணித்தியாலம் / Hours: 01 |

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1/ පුරාණ ගිවිසුමේ ජනවන්දනාවට අදාළ නීති නියෝග සඳහන් පොත වන්නේ
1. ලෙවී ව්‍යවස්ථාව 2. ගණන් කථාව 3. හිතෝපදේශය 4. ද්විතීය නීති සංග්‍රහය

2/ පූජක සම්ප්‍රදායට අයත් සිදුවීම් වන්නේ
A - මැවීම පිළිබඳ පළමු කථාව B - ඊසාක් පූජා කිරීම C - නෝවා සමග ගිවිසුම D - ආදම් ඒව පාපයට වැටීම
මින් නිවැරදි පිළිතුර වන්නේ
1. A හා D ය. 2. B හා Cය. 3. A හා C ය. 4. C හා D ය.

3/ ශුද්ධ බයිබලයේ ග්‍රීක් බසින් ලියන ලද පිටපත හඳුන්වනු ලබන්නේ
1. ඇරමයික් 2. මැසොරෙටික් 3. ප්‍රොෆේටෙස් 4. සෙප්ටුවාජින්ත

4/ සුළු දිවැසිවරු සඳහන් නිවැරදි පිළිතුර වන්නේ
1. ආමොස් / මීකා 2. එලිෂා / මලාකි 3. හොසියා /මීකායා 4. අභියා / ඔබදියා

5/ " මනුෂ්‍ය පුත්‍රය, මේ පොත අනුභව කර ගොස් ඉශ්‍රායෙල් වංශයට කථා කරන්නැ යි " වදාළ සේක. මෙය කා විසින් කා හට කියන ලද්දක් ද?
1. දෙවියන් වහන්සේ විසින් ක්‍රිස්තුන් වහන්සේට 2. දෙවියන් වහන්සේ විසින් හොසියා දිවැසිවරයාට
3. දෙවියන් වහන්සේ විසින් එසකියෙල් දිවැසිවරයාට 4. ක්‍රිස්තුන් වහන්සේ විසින් පේදුරු තුමාට

6/ පුරාණ ගිවිසුමේ මෝසෙස් තුමා මෙන් නව ගිවිසුමේ නීති දායකයාණන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ බව පෙන්වා දෙන ශුභාරංචි කතුවරයා වන්නේ
1. ශුද්ධ වූ ලූක් තුමා 2. ශුද්ධ වූ මතෙව් තුමා 3. ශුද්ධ වූ ජොහන් තුමා 4. ශුද්ධ වූ මාක් තුමා

7/ "නුඹ ගෙයක් දොරක් නැති මිහිපිට ඉබාගාතේ යන මිනිසෙක් වන්නෙහිය. " මෙය කා විසින් කා හට කියන ලද්දක්ද?
1. දෙවියන් වහන්සේ විසින් කායින්ට 2. දෙවියන් වහන්සේ විසින් ආදම්ට
3. ක්‍රිස්තුන්වහන්සේවිසින් නාස්තිකාර පුත්‍රයාට 4. ක්‍රිස්තුන් වහන්සේ විසින් ධනවත් තරුණයාට

පහත තොරතුරු උපයෝගී කරගෙන 8,9 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
A -මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි. B - ආහාර සඳහා මන්නා ලැබීම
C- නොදැවෙන කටු පඳුර තුළින් D- මාරා හි දී බීමට ජලය ලැබීම
E - මිසර වැසියන්ට වසංගත දහයක් එවීම

8/ ඉශ්‍රායෙල් ජනතාව නික්මයාම ගමන තුළ දිව්‍ය සංරක්ෂණය අත් දුටු අවස්ථා වන්නේ
1. A හා B ය. 2. B හා C ය. 3. C හා E ය. 4. B හා D ය.

9/ දෙවියන් වහන්සේ මොසෙස් තුමාට දර්ශනය වූයේ

1. A ය 2. B ය. 3. E ය 4. C ය

10/ දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කර ගන්නා ලද ගිවිසුමේ බාහිර සලකුණ වූයේ

1. දේදුන්න 2. බෞතීස්මය 3. චර්මඡේදනය 4. සර්පයා

11/ " ඔහු ස්වාමීන් වහන්සේ අබිමුවෙ හි ශ්‍රේෂ්ඨ වන්නේය. ඔහු මිදි යුෂවත් මත්පැන්වත් නොබොන්නේය. මව්කුස සිට ම ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්නේය. " මෙම ප්‍රකාශයෙන් කියවෙන්නේ කවුරුන් ගැනද?

1. ක්‍රිස්තුන් වහන්සේ ගැන ය. 2. ස්නාවක ජුවාම් තුමා ගැන ය.
3. යෙසායා දිවැසිවරයා ගැන ය. 4. ශුද්ධ වූ පාවුලු තුමා ගැනය.

12/ ජේසුස් වහන්සේ මුහුණ දුන් තුන් වන පරීක්ෂාවට පිළිතුර වූයේ " නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න. කියා ලියා ඇත. " යනුවෙනි. එයින් ඔබට ලැබෙන පණිවුඩය වන්නේ

1. කීර්තිය පතා කටයුතු නොකළ යුතුය. 2. ජේසුස් වහන්සේව පරාජය නොකළ හැකි බවය.
2. අපජීවිතය ධනයට බලයට ලබා නොදිය යුතුය. 4. තමන් සතු බලය සමාජ යහපත සඳහා යෙදිය යුතුය.

13/ ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියාවන්ගේ හරය වූයේ

1. දේව කැමැත්තට නතු වීමයි 2. දේව රාජ්‍යය ගොඩ නැගීමයි
3. දේව පාලනයට නතු වීමයි 4. දේව රාජ්‍යයේ උදාවයි

14/ "යමෙක් වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකිය. " මෙය කා විසින් කා හට කියන ලද්දක් ද?

1. ක්‍රිස්තුන් වහන්සේ විසින් අපෝස්තුලුවරුන්ට 2. ක්‍රිස්තුන් වහන්සේ විසින් නිකදේමුස්ට
3. ක්‍රිස්තුන් වහන්සේ විසින් ජෙරුසලම් වැසියන්ට 4. ක්‍රිස්තුන් වහන්සේ විසින් පරිසිවරුන්ට

15/ ප්‍රසාද ස්නාපනය මාර්ගයෙන් ඔබ ශුද්ධාත්මයාණනගේ මන්දිරයක් වූයෙහි ය. බරපතල පාපයක් කිරීමෙන් ඒ සා මහත් සම්භාවනීය තැනැත්තෙකු ඔබගේ හෘදයෙන් පළවා නොහරින්න. මෙසේ ප්‍රකාශ කළේ

1. ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා 2. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා
3. ශුද්ධ වූ මහා ලියෝ ශුද්ධොතම පියතුමා 4. ශුද්ධ වූ දෙවන ජුවාම් ශුද්ධොතම පියතුමා

ප්‍රසාද නිධාන ගැන අවධානය යොමු කරමින් 16- 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුර සපයන්න

A - ප්‍රසාද ස්නාපනය B - අභිවෘද්ධි ආලේපය C - සමගි සන්ධානය D - රෝගීන්ගේ ආලේපය
E - පූජකවරය F - ආශීර්වාදකාර බන්ධනය G - දිව්‍ය සත්ප්‍රසාදය

16/ සුවදානයේ ප්‍රසාද නිධානය වනුයේ

1. A , B හා C ය. 2. B හා C ය. 3. D හා E ය. 4. C හා D ය.

17/ ජනතා සේවය සඳහා ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධාන වන්නේ

1. E හා Fය. 2. A හා E ය. 3.B හා F ය. 4. B , E හා F ය.

18/ පරිනත කිතුනුවකු හා ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ සාක්ෂිකරුවකු ලෙස වචනයෙන් ක්‍රියාවෙන් විශ්වාසය පැතිරවීමට ශක්තිය ලැබෙන්නේ කුමන දේව ප්‍රසාද නිධානය තුළින් ද?

1. E ය. 2. F ය. 3. B ය. 4. C ය.

19/ ආරම්භක දේව ප්‍රසාද නිධාන වන්නේ

1. A හා B ය. 2. A , B හා G ය. 3. A , B හා C ය. 4. A , B හා E ය.

20/ ජීවිතයේ එක් වරක් පමණක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධාන වන්නේ

1. A , B හා E ය 2. A ,B හා F ය. 3. B , E හා F ය. 4. A , B , E හා F ය.

21/ මින් පශ්චාත්තාප ක්‍රියා වන්නේ

1. යාච්ඤාව / දන්දීම 2. දන් දීම / පල්ලි යාම
3. නිරාහාරශීල රැකීම/ගී ගැයීම 4. යාච්ඤාව /නවකතා කියවීම

22/ තේවාචාරිවරුන්ගේ වගකීම් වන්නේ

A - පිළිවෙත් අනුව ප්‍රසාද ස්නාපනය දානය කිරීම B - අභිවෘද්ධි ආලේපය දානය කිරීම

C - අවමංගල්‍ය පිළිවෙත් සිදු කිරීම D - දිව්‍ය සත්ප්‍රසාද ආශීර්වාදය දානය කිරීම

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ

1. A , B හා C ය. 2. A හා B ය. 3. A ,C හා D ය. 4. C හා D ය.

23/ අත්තික්කා කොළ , අතු ඇද සිටි මිනිසාට වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ

1. දෙවියන් වහන්සේගේ ප්‍රේමයයි 2. දෙවියන් වහන්සේගේ දයාවයි
3. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයයි 4. දෙවියන් වහන්සේගේ කරුණාව හා රැකවරණයයි

24/ පැවිදි ජීවිතයේ ලක්ෂණ වන්නේ

1. සේවයේ ජීවිතය / පූජක බඹසර 2. කීකරුකම/යාච්ඤාවේ ජීවිතය
2. සාංඝික ජීවිතය /සේවයේ ජීවිතය 4. දිළිඳුකම /සාංඝික ජීවිතය

25/ පොදු පූජකවරය තුළ අප ලැබූ ත්‍රිවිධ කැදවීම් වන්නේ

1. නායක/ පූජක / දිවැසි 2. දිවැසි /රදගුරු / පූජක
3. දිවැසි / පූජක /රාජකීය 4. දිවැසි /තේවාචාරී / රදගුරු

26/ මරිය හමුදාව ආරම්භ කරන ලද්දේ ;

1. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා 2. ෆෑන්ක් ඩෆ් මහතා
3. පෙඩ්රික් ඕසනාම් තුමා 4. අති උතුම් ජෝශප් කාදිනල් කාඩයින් හිමිපාණන්

27/ දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු වන්නේ ,

A - දෙවියන් වහන්සේට නමස්කාර කිරීම B - ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීම

C - ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම D - පාපයන්ට වන්දි ගෙවීම

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ

1. A හා B ය. 2. A හා D ය. 3. B ,C හා D ය. 4. C හා D ය.

28/ ෆැන්සිස් වෙනුවට තමා මරණයට පත් කරන ලෙස නාසිවරුන්ගෙන් ඉල්ලා සිටියේ

1. ශුද්ධ වූ අන්තෝනි තුමා 2. ශුද්ධ වූ පාවුලු තුමා
3. ශුද්ධ වූ ස්තේපන් තුමා 4. ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමා

29/ ප්‍රථම වරට පූප හා මිදි යුෂ ගෙන දෙවියන් වහන්සේට ඔප්පු කළේ

1. මෙල්කිසදෙක් පූජක තුමා 2. නායක පූජකයන් 3. සකරියස් පූජක තුමා 4. සාමුවෙල් තුමා

30/ “කිසියම් කෙනෙකු මුළු ජීවිතය තුළම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටු කර ගත නොහැකිය.“ මෙය කාගේ අවසන් ඔවදනද?

1. මයිකල් රුද්‍රිගු පියතුමාගේ 2. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාගේ
3. ශුද්ධ වූ සෙබස්තියන් මුනිතුමාගේ 4. ශුද්ධ වූ පේදුරු තුමාගේ

31/ ඒකත්වය යනුවෙන් අදහස් කරන්නේ

1 . ශුද්ධ වූ සභාවේ දූත කාර්යයේ අනන්‍යතාවයයි 2. ශුද්ධ වූ ත්‍රිත්වයට ඇති සම්බන්ධතාවයයි
3. ශුද්ධ වූ සභාවේ විශ්වීය බවයි 4. ශුද්ධ වූ සභාවේ එකමුතු කමයි

32/ සාවුල් තුමාට ප්‍රසාද ස්නාපනය ලබා දුන්නේ

1. ආබ්‍රහම් තුමා 2. ශුද්ධ වූ පේදුරු තුමා 3. ශුද්ධ වූ ජාකොබ් තුමා 4. අනනියස්

33/ අපෝස්තුලුවරුන් දොළොස් දෙනා අතරින් පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා වන්නේ

1. ශුද්ධ වූ මහ ජාකොබ් තුමා 2. ශුද්ධ වූ පාවුලු තුමා 3. ශුද්ධ වූ ස්තේපන් තුමා 4. ශුද්ධ වූ පේදුරු තුමා

34/ “පෙන්තකොස්ත“ යන වචනයේ අර්ථය වන්නේ

1. හැත්තෑව 2. හතළිහ 3. පණහා 4. දහය

35/ ලේඛන ගත වී නැති ජේසුස් වහන්සේ කළ කී දේ ශුද්ධ වූ සභාව අපට දානය කරන්නේ :
1. නව ගිවිසුමේය 2. ද්විතීය සම්මත ග්‍රන්ථ වලය 3. ශුභාරංචි ග්‍රන්ථවලය 4. ජීවන සහා සම්ප්‍රදායේය

36/ ශුද්ධ වූ පාවුලු තුමා විසින් ම ලියන ලද සංදේශ වන්නේ ;
A - රෝම B - තීතස් C - ගලාති D - එපීස
මින් වඩාත් නිවැරදි වන්නේ
1. A හා B ය. 2. A හා C ය 3. A , B හා C ය. 4. B , C හා D ය.

37/ ක්‍රි. ව. 80 – 96 අතර කාලය තුළ රෝම අධිරාජ්‍යය යටතේ වූ දරුණු පීඩන සමයක දී කිතුනුවන් ධෛර්යවත් කරනු පිණිස ලියවී ඇති පොත වන්නේ
1. එළිදරව් පොත 2. 1 මකබි පොත 3. දානියෙල් පොත 4. එස්රා පොත

38/ " නුඹට සමාන කෙනෙකු නුඹට පළමුවෙන් සිටියේවත් නුඹට පසුව සිටින්නේවත් නැතිවන ලෙස තියුණු නැණ නුවණ නුඹට දෙමි ." මෙය කා විසින් කා හට කියන ලද්දක්ද?
1. දෙවියන් වහන්සේ විසින් දාවිත් රජතුමාට 2. ක්‍රිස්තුන් වහන්සේ විසින් හෙරෝද් රජතුමාට
3. දෙවියන් වහන්සේ විසින් මෝසෙස් තුමාට 4. දෙවියන් වහන්සේ විසින් සලමොන් රජතුමාට

39/ අන්‍යජාතීන්ගේ අපෝස්තුලුවරයා යන ගෞරව නාමය ලැබුනේ
1. ශුද්ධ වූ ලූක් තුමාට 2. ශුද්ධ වූ පාවුලු තුමාට
3. ශුද්ධ වූ පේදුරු තුමාට 4. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමාට

40/ ජුදෙව්වන් වසරක් පාසා උත්සවාකාරයෙන් සිදුකළ මංගල්‍යය වන්නේ
1. පාස්කු මංගල්‍යය 2. නත්තල් මංගල්‍යය 3. කූඩාරම් මංගල්‍යය 4. පෙන්තකොස්ත මංගල්‍යය

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: 2 | පැය / மணித்தியாலம் / Hours: 02 |

- පළමුවන ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක්ද ,තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

01.
(1) සුවදානයේ ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
(2) පදවි පූජක පොරොන්දු දෙක ලියන්න.
(3) ශුද්ධ වූ සභාව විසින් ජනවන්දනා වසරේ මනස්ථාපනය සඳහා වෙන් කර ඇති කාල පරිච්ඡේද දෙක නම් කරන්න.
(4) කිතුනු විවාහයේ ලක්ෂණ දෙක නම් කරන්න.
(5) මතෙව් ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නම් දෙකක් ලියන්න.
(6) ඉශ්‍රායෙල් දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
(7) ශුද්ධ වූ පාවුලු තුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න
(8) ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේ දී ස්ථාපිත කළ ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
(9) ඉශ්‍රායෙලයේ පූජා ප්‍රධාන කොටස් දෙකකි. එය නම් කරන්න
(10) ශුද්ධ වූ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති කෘතීන් දෙක නම් කරන්න.

02 . (1) ගරු මයිකල් රුද්‍රිගු පියතුමා යොමු වූ ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් ලියන්න
(2) ගරු මයිකල් රුද්‍රිගු පියතුමා දිළිඳු ජනතාව මුල් කර ගනිමින් කරන ලද ව්‍යාපාර හරහා ඉස්මතු වූ ප්‍රධාන කරුණු තුන ලියන්න.
(3) ගරු මයිකල් රුද්‍රිගු පියතුමා කළ සේවය අද සමාජය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ කිතුනු කැඳවීමට අනුව සාක්ෂි දරණ ආකාරය කරුණු පහකින් විස්තර කරන්න.

03. (1) කෝට්ටේ රාජ්‍යය පෘතුගීසි පාලනයට නතු වීමත් සමග මෙරට සේවය සඳහා පැමිණි පැවිදි නිකායික ධර්මදූත කණ්ඩායම් දෙකක් ලියන්න.
(2) ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ එම ප්‍රදේශවල ජීවත් වූ කතෝලිකයන්ට එල්ල වූ පීඩන තුනක් ලියන්න
(3) ශ්‍රී ලංකාව තුළ විවිධ පීඩන සමයන් හි දී කතෝලික දහම ආරක්ෂා කර ගැනීමට ධර්දූත වරුන්ගේ කැපවීම ඉමහත් රුකුලක් විය. අද ඔබ කතෝලික දහම රැකගැනීමට ගන්නා ක්‍රියා මාර්ග 5 ක් ලියා විස්තර කරන්න.

04. (1) ශුද්ධ වූ බයිබලයේ උත්පත්ති පොතට අනුව දේව දඬුවමට ලක් වූ පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න
(2) දෙවියන් වහන්සේ නෝවා කැඳවීමට හේතු වූ ප්‍රධාන කරුණු තුන ලියා දක්වන්න.
(3) නෝවා මෙන් ජීවිතයක් ගත කිරීමට ඔබේ ජීවිතයට එකතු කර ගත යුතු ගුණාංග පහක් ලියා විස්තර කරන්න.

05. (1) කිතුනු විවාහයේ පරමාර්ථ දෙක ලියන්න.
(2) " විවාහය යනු ගිවිසුමකි" ආශිර්වාදකාර බන්ධනය තුළ විවාහක යුවල බැඳෙන පොරොන්දු තුන ලියන්න
(3) කතෝලික විවාහ ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කරුණු පහක් ලියා විස්තර කරන්න.

06. (1) දේශක දිවැසිවරුන්ගේ වචන හා ක්‍රියා පිළිබඳ ශුද්ධ ලියවිල්ලේ සඳහන්ව ඇති ග්‍රන්ථ දෙක නම් කරන්න
(2) ජෙරමියා දිවැසිවරයා දිරිමත් කිරීම සඳහා දෙවියන් වහන්සේ ප්‍රකාශ කළ වගන්ති තුනක් ලියන්න.
(3) ජෙරමියා දිවැසිවරයා මෙන් අපගේ දුර්වලකම් තුළ දෙවියන් වහන්සේ අපට පවරා දී ඇති වගකීම් හා යුතුකම් ඔබ මීසම ඉටු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පහක් ලියා විස්තර කරන්න

07. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (පේළි 12ක් පමණ)
(1) භාග්‍ය අට තුළින් දේව රාජ්‍යයේ වටිනාකම්
(2) අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමා
(3) ප්‍රඥා සාහිත්‍යයේ අරමුණු හා එහි ආධ්‍යාත්මිකත්වය
(4) පැවිදි දිවියේ ඓතිහාසික පසුබිම